හික්කඩුව නගර සභාව

ගාල්ල දිස්ත්‍රික්කය

---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හික්කඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ගිණුම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර වූ රු.2,229,328 ක වෙනස හඳුනා ගැනීමෙන් තොරව ජර්නල් සටහන් 07 මඟින් සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය තුල ආධාර ලෙස සභාවට ලැබී තිබූ රු.80,450 ක් වූ ස්ථාවර වත්කම්, මූලධන ආධාර ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් සමුච්චිත අරමුදල හා ස්ථාවර වත්කම් රු.80,450 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දී සමීක්ෂණ මණ්ඩල වාර්තා නිර්දේශයක් නොමැතිව ජර්නල් සටහන් අංක 39 මඟින් රු.511,833 ක ආයුර්වේද බෙහෙත් තොගයක් ගිණුම්වලින් ඉවත් කර තිබූ අතර එකී ඉවත් කිරීම ගිණුම්ගත කිරීමේ දී සදොස් ලෙස රු.511,833 කින් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුම හර කර තිබීම නිවැරදි නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ආයුර්වේද තොගය සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුමේ ශේෂය රු.511,833 බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පුස්තකාල පොත් මිලදී ගැනීම් රු.312,305 ක් සහ පරිත්‍යාග රු.16,790 ක් ද වශයෙන් එකතුව රු.329,095 ක් ජර්නල් සටහන් අංක 52 මඟින් රු.577,607 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබීමෙන් පුස්තකාල පොත් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂ රු.248,512 බැගින් වැඩියෙන් දැක්විණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගත් රු.307,845 ක් වූ ස්ථාවර වත්කම්, පරිත්‍යාග ලෙස ලද රු.147,790 ක ස්ථාවර වත්කම් සහ වටිනාකම සඳහන් නොවූ ස්ථාවර වත්කම් 03 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ රු.20,606 ක් වූ ස්ථිර තැන්පත් පොළිය ආදායමට නොගැනීමෙන් මූල්‍ය ප්‍රකාශනවල රු.20,606 කින් පොළී ආදායම අඩුවෙන් දැක්විණි.

(උ) වර්ෂයේ මුද්දර බදු ගෙවීම් රු.23,291 ක් විවිධ තැන්පතු ගෙවීම් ලෙස සටහන් කිරීම නිසා ගෙවිය යුතු මුද්දර බදු ගිණුම රු.23,291 ක් වැඩියෙන් ද, ගෙවිය යුතු විවිධ තැන්පතු ගිණුම රු.23,291 ක් අඩුවෙන් ද දැක්විණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින කර්මාන්ත ණයහිමි ශේෂය රු.13,441,517 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.10,013,579 ක් ලෙස දැක්වීම නිසා රු.3,427,938 කින් ණයහිමියන් අඩුවෙන් දැක්විණි.

(එ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත වියදම රු.7,007,402 ක් වුවද, ප්‍රාග්ධන වියදම් ගිණුමට රු.5,552,748 ක් ලෙස දැක්වීම නිසා රු.1,454,654 කින් ප්‍රාග්ධන වියදම් අඩුවෙන් දැක්විණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දී ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.10,000,000 ක් වුවද, ලැබිය යුතු මුද්දර ගාස්තු ණයගැතියන් රු.9,584,921 ක් වීමෙන් රු.415,079 කින් ණයගැතියෝ අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) ඉකුත් වර්ෂයට අදාල කර්මාන්තයක් වූ දෙල්ගහදූව කටුකොලිහ පිංකන්ද ග්‍රාම නිලධාරී වසමේ ඉදිවන ප්‍රජා ශාලාව ඉදිකිරීම II අදියර වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලද රු.679,962 ක් මුද්දර ගාස්තු ලැබීම් ලෙස සටහන් කිරීම නිසා කර්මාන්ත ණයගැතියෝ රු.679,962 කින් වැඩියෙන් ද ලැබිය යුතු මුද්දර ගාස්තු රු.679,962 කින් අඩුවෙන් ද දැක්විණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්තයක් වන හෙන්නාතොට ගොරකාගස් බොක්ක සහ පටුවත ගම්මඩුවත්ත ප්‍රජා ශාලා දෙකේ වැඩ අවසන් කරලීම සඳහා ලද රු.1,000,000 ක් මුද්දර ගාස්තු ලැබීම් ලෙස දැක්වීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන ආධාර හා ලැබිය යුතු මුද්දර ගාස්තු එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දැක්විණි.

(ක) සමාලෝචිත වර්ෂයේ උඩුගල්පිටිය ප්‍රජා ශාලාව ඉතිරි වැඩ නිම කිරීම් කර්මාන්තය හා ත්‍රිරෝද රථ ගාල පිළිසකර කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ලද රු.1,050,000 ක් ලැබිය යුතු මූලධන ආධාර ගිණුමට බැර කිරීම නිසා වර්ෂයේ මූලධන ආධාර හා ලැබිය යුතු මූලධන ආධාර එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දැක්විණි.

(ග) ඉකුත් වර්ෂයේ කර්මාන්ත 03 ක් වෙනුවෙන් ලද රු.540,000 ක් සඳහා ඉකුත් වර්ෂයේ ප්‍රතිපාදන සලසා නොතිබිය දී ලැබිය යුතු මූලධන ආධාර ගිණුමට බැර කිරීම නිසා ලැබිය යුතු මූලධන ආධාර ගිණුම හා සමුච්චිත අරමුදල රු.540,000 බැගින් අඩුවෙන් දැක්විණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය තොගය රු.212,212 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.159,240 ක් ලෙස දැක්වීම නිසා රු.52,972 ක වෙනසක් දැක්විණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

---------------------------

ගිණුම් විෂයයන් 06 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපලේඛන අනුව ශේෂයන් අතර රු.9,732,533 ක වෙනසක් පැවතුණි.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට වූ රු.2,163,259 ක් වූ හර ශේෂයට ජර්නල් සටහන් අංක 04 හා 05 මගින් හඳුනා ගන්නා ලද රු.205,368 ක් හර කර, ජර්නල් සටහන් අංක 09 මගින් රු.1,620,400 ක් හඳුනාගෙන බැර කිරීමෙන් පසුව ඉතිරි වූ රු.748,227 ක ශේෂය හඳුනා ගැනීමකින් තොරව අධිකතා හා ඌනතා ගිණුමට ගලපා තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.73,566,409 ක් වූ ගනුදෙනු සම්බන්ධව යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබූ ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන හා සමීක්ෂණ මණ්ඩල වාර්තා, තොග ලේඛනය හා උපලේඛන, කාල විශ්ලේෂණය හා ශේෂ සනාථ සහතික සහ යාවත්කාලීන කරන ලද තැන්පතු ලේඛන හා උපලේඛන පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.12,576,438 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.13,342,124 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---------------------

**2.2.1 වරිපනම් බදු**

----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතුව තිබූ රු.18,381,744 ක් වූ වරිපනම් බදු නගර සභා ආඥා පනතේ 170අ(2) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.2 බදුකුලී**

---------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතුව තිබූ රු.6,843,114 ක් වූ බදුකුලී නගර සභා ආඥා පනතේ 170අ(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.3 බලපත්‍ර ගාස්තු**

---------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතුව තිබූ රු.676,669 ක් වූ බලපත්‍ර ගාස්තු නගර සභා ආඥා පනතේ 170අ(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු. 822,501 ක උසාවි දඩ හා රු.9,584,922 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.5 සංචාරක හෝටල්වලින් 1% බලපත්‍ර ගාස්තු අය නොකිරීම

------------------------------------------------------------

නගර සභා ආඥා පනතේ 164 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වූ හෝටල්, ආපන ශාලා සහ ලැගුම්හල් සඳහා පෙර වර්ෂයේ ලැබීම් මත 1% ක බලපත්‍ර ගාස්තුවක් අය කළයුතු වුවත්, සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන සංචාරක අධිකාරියේ ලියාපදිංචි හෝටල්, ආපන ශාලා සහ ලැගුම්හල් 04 කින් 1% ක බලපත්‍ර ගාස්තු අය කරගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2000 දෙසැම්බර් 13 දිනැති අංක : 1162/12 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් හික්කඩුව නගර සභාව 2001 අප්‍රේල් 15 දින සිට ප්‍රකාශයට පත්කර තිබුණි. 2002 අප්‍රේල් 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පූර්වයෙන් හික්කඩුව ප්‍රාදේශීය සභාව සතුව පැවති වත්කම් හා වගකීම් අතුරින් නගර සභාවට පැවරෙන කොටස නිශ්චිත වශයෙන් බෙදා වෙන් කිරීමක් විගණන දිනය වූ 2015 අගෝස්තු 20 වනවිටත් සිදුකර නොතිබුණි.

**(ආ)** 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාවේ උප සභාපතිවරයා සහ සභිකයින් 07 දෙනෙකු 2014 වර්ෂය සඳහා වූ වත්කම් හා බැරකම් ප්‍රකාශ විගණන දිනය වූ 2015 අගෝස්තු 20 දින දක්වා ලබා දී නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සේවක ණය**

-------------

සභාවේ සේවය කරන ලද සේවකයන් (මාරු වී ගිය/විශ්‍රාම ගිය) 04 දෙනෙකුගෙන් අයකර ගතයුතුව තිබූ රු.183,769 ක ණය ශේෂයෙහි අයවීම් වර්ෂයක සිට වර්ෂ 06 ක් දක්වා වූ කාලපරිච්ඡේදයක් තුළදී හිඟ හිටව තිබුණි.

සභාවේ සේවය කරන ලද ආදේශක සේවකයින් 13 දෙනෙකුගෙන් අයකර ගතයුතුව තිබූ රු.40,900 ක ණය ශේෂයක් වර්ෂ 02 සිට වර්ෂ 10 ක කාලපරිච්ඡේදයක් තුළදී අයවීම් හිඟහිටව පැවතිය ද, එම මුදල් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) සේවක ඇප තැන්පත්**

------------------------

මුදල් භාරකරු සහ දේපල තහනම් කිරීමේ නිලධාරීන් දෙදෙනා හැර අනෙක් ඇප තැන්පත් කළයුතු නිලධාරීන් විසින් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 880 සහ 881 ප්‍රකාරව 2015 අගෝස්තු 20 විගණන දින දක්වා අවශ්‍ය ඇප මුදල් තැන්පත් කර නොතිබුණි.

**(ඇ) අත්තිකාරම් ගෙවීම**

----------------------

සභා අරමුදලින් නිලධාරීන් හා සේවකයන් වෙත 2014 වර්ෂයේ දී ලබා දී තිබූ අත්තිකාරම්වලින් රු.57,000 ක් ද, 2014 වර්ෂයට පෙර ලබා දී තිබූ අත්තිකාරම්වලින් රු.147,665 ක් ද වශයෙන් එකතුව රු.204,665 ක් විගණන දිනය වූ 2015 අගෝස්තු 20 දින වනවිටත් පියවා නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

-----------------------------

සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 14 ක නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සභාව විසින් සිදු කරනු ලැබුව ද, විගණන දිනය වූ 2015 අගෝස්තු 20 දින වනවිටත් එකී වාහනවල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

**3.4 නිෂ්ක්‍රීය වත්කම්**

------------------

ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍ර උපකරණ අපහරණය පිළිබඳ ජනාධිපති ලේකම් විසින් 2013 ජුනි 05 දින නිකුත් කරන ලද අංක : PCMD/PR/2013 දරන චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙස දන්වා තිබුණ ද, බැකෝ ලෝඩරයක්, ගිනි නිවන ආපදා රථයක්, ගලි බවුසරයක් සහ ට්‍රැක්ටරයක් විගණන දිනය වූ 2015 අගෝස්තු 20 දින වනවිට ද අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර, දිරාපත් වෙමින් පැවතුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

---------------------

ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලන**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය